# පරිසර 'හවුල' මුදල් අමාරුවක

පරිසරය රැක ගැනීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකාව ඇතුළු ආසියාතික රටවල් දහයක් එක්වී පිහිටුවා ගෙන ඇති දකුණු ආසියා සහයෝගිතා පරිසර වැඩ සටහන (සකෙප්) බලවත් ආර්ථික දුෂ්කරතාවකට මුහුණ පා සිටී.

මේ ප්‍රශ්නය උද්ගත වී ඇත්තේ මෙම වැඩ සටහනට සම්බන්ධ ඇතැම් සාමාජික රටවලින් පොරොන්දු වී ඇති ආධාර මුදල් තවමත් ලැබී නැති නිසාය.

දකුණු ආසියා සහයෝගිතා පරිසර වැඩ සටහනේ ප්‍රථම පාලක මණ්ඩල රැස්වීම මේ දිනවල කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වේ.

මෙම රැස්වීම ඇමතූ ඊට සහභාගි වන ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ සාමාජිකයෙකු සහ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති විද්‍යාඥ වන කේ. එච්. ජේ. විජේදාස මහතා, සකෙප් වැඩ සටහනට මුදල් අතින් මුහුණ පෑමට සිදුවී ඇති දුෂ්කරතා මඟහරවා ගැනීමට ආධාර කරන ලෙස සාමාජික රටවලින් විශේෂ ඉල්ලීමක් කළේය.

'සකෙප්' වැඩ සටහන සඳහා ශ්‍රී ලංකාව 1982 වර්ෂය වනවිට ඩොලර් 1,10,000 ක පමණ මුදලක් ආධාර වශයෙන් ලබාදී ඇති අතර, එක්සත් ජාතීන්ගේ පරිසර වැඩ සටහනින් ඩොලර් 4,000 ක්ද, ඇෆ්ගනිස්ථානයේ ඩොලර් 1,500 ක් සහ පාකිස්තානයෙන් ඩොලර් තුන්දාහක්ද ආධාර වශයෙන් ලැබී ඇතැයි කීය.